# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**නිවාඩු කාලීන පැවරුම්**

**සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය**

# 1 ශ්‍රේණිය - පරිසරය (තෙවන සතිය)

**12 තේමාව - ගමන් බිමන්**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු කියන්න.**

.

1. ඉරියව් පෙන්වන්න- ඉඳ ගැනීම, සිට ගැනීම, බරක් එසවීම, ගමන් යාම
2. වැඩිවීම පිළිබඳ සමාජයේ පවතින සිරිත් විරිත් දෙමව්පියන්ගෙන් අසා දැනගන්න. ( වැඩිහිටියන් සිටගෙන සිටින විට දරුවා වැඩි වී සිටීම නුසුදුසු බව/ආගමික නායකතුමන්ලා දුටු විට නැගිටීම,ආචාර කිරීම/ පියා ,මව සමග සම අසුන් වල වාඩි නොවීම)
3. දෙමාපියන් දරුවන්ට වාඩිවීමේ නිවැරදි ක්‍රමය කියා දෙන්න.තම පාද, ඇඳුම් පැළඳුම්,පුටු කකුල් පිළිබඳව අවබෝධය ලබාදීම)
4. පහත විවිධ ආකාර වලට ඇවිද බලන්න.
    - නිදහසේ ඇවිදින්න
    - රේඛාවක් දිගේ ඇවිදින්න
    - වමට දකුණට හැරී හැරී ඇවිදින්න
    - පාද ළඟින් තබමින් ඇවිදින්න
    - පාද ඈතින් තබමින් ඇවිදින්න
    - උරහිස් වලට දෑත් තබාගෙන ඇවිදින්න
5. හිස මත යමක් තබාගෙන සමබරව ඇවිදින්න, දුවන්න.
6. ගොඩබිම, අහසේ සහ ජලයේ ගමන් කරන වාහන වල පින්තූර එකතු කරන්න. අලවන්න.

7. නිවසට ගෙන එන භාණ්ඩ වල ලේබල් හා ඇසුරුම් එකතු කරන්න. පොතක අලවන්න.
8. ඔබේ ගෙවත්තේ වගා කල හැකි දේ මොනවාද? දෙමව්පියන්ගේ සහාය ඇතිව කුඩා ගෙවත්තක් සකස් කරන්න.
9. වෙළඳපොළක අත්දැකීම් දෙමව්පියන්ගෙන් අසා දැනගන්න.
10. එළවලු, පලතුරු, පළා,ඇට වර්ග(ධාන්‍ය) වල නම් අසා දැනගන්න.
11. පාවිච්චි කිරීමෙන් පසු ඉවත දමන දේවල් වලින් සරල නිර්මාණයක් කරන්න. (බෑග්,කුඩ,පෙට්ටි,මල්,එළවලු,පලතුරු,අත්කම්)
12. බෙදා හාදාගෙන ජීවත්වීමේ වටිනාකම දෙමාපියන්ගෙන් අසා දැනගන්න.
13. දෙමව්පියන්ගේ උදව් ඇතිව ස්වභාවික වර්ණ කිහිපයක් සාදාගන්න. (වදමල්,ගඩොල් කුඩු,අඟුරු, බීට්,නිල කටරොල් මල්)
14. ඉහත සාදාගත් වර්ණ වලින් හබරල පිති, බණ්ඩක්කා, ආදියෙන් නිර්මාණයක් කරන්න.